


2010 නොවැම්බර් 15 වැනි දින දිවයින පත්තරයේ විශේෂාංගයට ලියන ලිපියක් ලස්සන ශීර්ෂ පාඨයකින් යුතු වූවකි. -ජන විඥානය අනුභව කිරීම"

රනිල් වික්‍රමසිංහට එරෙහිව කොතරම් කෑ කෝ ගැසීම් පටන් ගත්තත් ඒ සියල්ලම ටික දිනකින් මුළු රටටම අමතක කරවීමේ පුදුම බලයක් ඔහුට ඇති බව සිතමින් සිටි මා මහ පොළොවට පාත් කරවන්නට එය ලියූ සී ඒ චන්ද්‍රප්‍රේම සමත් වූ බව කිව යුතු ය.

ඔහු මා මෙන් දුර සිට ජේන කියන්නෙක් නොවේ. දේශපාලනයට කෙළින්ම නොවූවත් දිගටම යා වී සිටි - දේශපාලන පලිගැනීම් නිසා සිරබත් කෑ - පළපුරුදු විචාරකයෙකි. ඔහු මෑතකදී කරු ජයසූරිය ගැන ලියූ විග්‍රහය ඒ බව සනාථ කළේ ය. මෙදා පාර ඔහු ලියන්නේ මගේ අනභිභවනීය වීරයා - එනම් රනිල් වික්‍රමසිංහ ගැන ය.

*රනිල් පමණක් නොව හැම කෙනකුම පිළිගත යුතු යථාර්ථයක් ඇත. මහින්ද රාජපක්ෂ ජනාධිපති තරගයේ (විශේෂයෙන් දෙවැනි වරට) ජයග්‍රහණය කළේ ගම නිසා බව - ගැමි ජනතාවගේ ඡන්දයෙන් බව - පැහැදිලිව පෙනී යාම ය ඒ.*

ඉදිරිපත් කිරීමට මම සමත්වෙමි. කලක් හොරණ මන්ත්‍රීධුරය දැරූ ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි කපා හරින ලද්දේ රනිල් විසිනි. රනිල් නොදත් අන් සියල්ලන්ම දැන සිටි සත්‍යය වූයේ මුළු හොරණ පෙදෙසේම සිටි දේශපාලකයන් අතුරින් විරුද්ධ පාක්ෂිකයන්ගේ පවා සිත් දිනා ගත් එකම පුද්ගලයා ඉන්ද්‍රදාස වීම ය.

පසුගිය මහ මැතිවරණයේදීත් ඔහු මේ දුබලතාව

ය. රනිල් වික්‍රමසිංහ සිය බෞද්ධ උපාසක භාවය ප්‍රදර්ශනය කිරීමට වරින් වර මල්වත්තට යන වන්දනා ගමන ගැන හෝ කොටි සංවිධානයට පනවා තිබූ තහනම ඉවත් කිරීමට කලින් ඔහු විසින් මහනායක හාමුදුරුවන්ට පිළිගන්වන ලද ලක්ෂ (හෝ කෝටි) පහේ චෙක් පත ගැන කියා තිබුණේ ද නැත. රනිල් වික්‍රමසිංහ සිය බොදු සැදැහැව පෙන්වනු වස් පොතක්ද ලියා පළ කළේ ය. ඒ ගැන අද කතා කරන කෙනෙක් නැත. ඔහු බුද්ධ ගයාවේ පවත්වන ලද ධර්ම සංඝායනාවක් ගැන ද කීවේ ය. ඔහුට හරියට දොහොත් නගා වඳින්නට බැරි ය යයි ද නරුමයෝ කියති. කොහොම වුණත් ගමේ කම සකල ශරීරයෙන්ම ප්‍රදර්ශනය කරන මහින්ද රාජපක්ෂ ඉදිරියේ රනිල් ගමට ආගන්තුකයකු ලෙසින් පෙනී යාම පුදුමයක් නොවේ.

රනිල් පමණක් නොව හැම කෙනකුම පිළිගත යුතු යථාර්ථයක් ඇත. මහින්ද රාජපක්ෂ ජනාධිපති තරගයේ (විශේෂයෙන් දෙවැනි වරට)

# ජන විඥානය සොයා යාම

චන්ද්‍රප්‍රේම කතා කරන්නේ රනිල්ගේ නව දේශපාලන උපක්‍රමය වන ග්‍රාම චාරිකාව ගැන ය. අවුරුදු 60 ක් පරණ දේශපාලන පක්ෂයක් ගමට ගෙනයාම විහිළුවක් බව කියන ලේඛකයා සිතන්නේ රෝග නිදානය වනුයේ නායකයාට ජන විඥානයක් නොතිබීම බව ය. වෙනත් විදියකින් කියතොත් ගැමියාගේ (ජනතාවගේ) හද ගැස්ම නොහඳුනන නිසා ය. -ටේල් කෝට් ටොප් හැට්" ඇඳ ගත්තත් ඩී එස් සේනානායකගේ ගැමි උරුව රැකී තිබුණු බව



කියන ඔහු රනිල් සපුරා ගමෙන් දුරස් වූ චරිතයක් වීම නිසා ම ගමට පක්ෂය ගෙන යාමේ ව්‍යාපාරය අවශ්‍ය වූ බව පෙන්වා දෙයි.

එජාප ය ජනතාවට සමීප බව පෙන්වීමට කළ උත්සාහය ද ඔහුගේ අවඥාවට පාත්‍ර වන්නේ ය. ඔහුගේ වචනයෙන් ම ඒ අදහස -

"මේ ප්‍රශ්නයට පිළියමක් වශයෙන් එ.ජා.ප. ය කළේ තමුන් ජන විඥනයට සමීප යෑයි පෙන්වීමට රූපවාහිනී කැමරාවලට හසුවන පරිදි පන්සල් වෙහෙර විහාර ගානේ යෑම, භික්ෂූන් වහන්සේලාට වැඳීම, පිරිත් මණ්ඩප අසල වාඩිවී සිටීම, කැවුම්, කිරිබත් වැනි දේශීය ආහාර වර්ග අනුභව කිරීම, ප්‍රයිඩ් රයිස් සහ ඩෙවල්ඩ් චිකන් වුවත් නෙළුම් කොළයේ දමාගෙන කෑම, (රූපවාහිනී කැමරාවලට නෙළුම් කොළය පෙනුනත් ඩෙවල්ඩ් චිකන් පෙනෙන්නේ නැත.) වැව්වලට බැස දියබුං ගැසීම වැනි ක්‍රියාකාරකම්ය. නමුත් වසර 15 ක් පුරා කෙතරම් බෝධි පූජා පැවැත්වුවත්, කෙතරම් නෙළුම් කොළවල කිරිබත් කෑවත් එ.ජා.ප. ය ජනතාවට සමීප යෑයි යන අදහස නම් රට තුළ ජනිත වූයේ නැත."

ග්‍රාම චාරිකාව අවශ්‍ය වූයේ ඒ නිසා බව ද ඔහු පෙන්වා දෙයි. චාරිකාව පටන් ගත්තේ හොරණ පෙදෙසින් ය. කොහේ නැතත් හොරණ ගැන කියන විට නම් රනිල් වික්‍රමසිංහ ගේ ජන විඥාන ඉඩෝරය පැහැදිලිව පෙන්වා දෙන නිදසුනක් හොරණින්

ප්‍රදර්ශනය කළේ ය. බදුල්ලේ එජාප නියෝජිත කපා හළ ඔහු ඒ අපේක්ෂකයාට ඡන්දය නොදෙන්නැයි පාක්ෂිකයනට උපදෙස් දුන්නේ ය. ඡන්ද දායකයෝ ඔහුට දුන්නේ මතක හිටින කෙනෙකුට ජීවිතයට අමතක නොවන අතුල් පහරකි. ඊටත් වඩා ලස්සන කතාවක් මහියංගනයෙන් අසන්නට ලැබුණේය. ලක්ෂ්මන් සෙනෙවිරත්න රජයට පක්ෂව ඡන්දය දීමෙන් පසු සිය ඡන්ද කොට්ඨාශයට ගිය අවස්ථාවේදී ඔහු පිළිගැනීමට එජාප ප්‍රාදේශීය

කාර්යාලයේම උත්සවයක් පවත්වන ලද්දේ එජාප පාක්ෂිකයන් විසින් ම ය.

චන්ද්‍රප්‍රේමට අමතක වූ කරුණක් ද සඳහන් කළ යුතු

ජයග්‍රහණය කළේ ගම නිසා බව - ගැමි ජනතාවගේ ඡන්දයෙන් බව - පැහැදිලිව පෙනී යාම ය ඒ. ජනාධිපති පදවි ප්‍රාප්තිය වෙනුවෙන් ගමක් ගානේ පින්කම් පැවැත්වීමටත් රට පුරා රුක් රෝපනයටත් අදහස් කරන්නේ ඒ දැනුම අනුව ද යන ප්‍රශ්නයද මතු කළ යුතු ය.

මට මතක් වන නිදසුන් දෙකක් ඇත. එකක් අප ළමා අවදියේ පාඩම් පොතක ආ කතාවකි. අඹ ඇටයක් සිටවන මුත්තා වෙත අවුත් මුණුබුරා අසන ප්‍රශ්නය හා මුත්තා දෙන පිළිතුරත් කියන කතාව. තමා මතු පරපුර වෙනුවෙන් අඹ ගස් සිටවන බව මුත්තා මුණුබුරාට පෙන්වා දෙන්නේ අපටත් ඒ පිණිවුඩය දෙමින් ය.

දෙවැනි නිදසුන මා රැකියාව කරන කාලේ දුටුවකැයි කීම බොරුවකි. අසන්නට ලැබුණා දෙයක්. මැතිවරණයක් අවදියේ මහ මග අසල ලොකු ගසකත් කුඩා පැළයකත් එල්ලා තබන ලද පෝස්ටර් දෙකක්. -අපි වින්සන්ට" යනුවෙන් ලොකු ගස කියයි. -ලොකු වුණාම අපිත් වින්සන-"ට" යයි පැළය කියයි. ඒ පළාතේ හිටපු මන්ත්‍රී වන වින්සන් පෙරේරා ගේ දැව ජාවාරමට එල්ල කළ පහරකි ඒ.

වින්සන් පමණක් නොවේ. අදත් ඔය විදියට කැලෑ ගස් කපන ජාවාරමේ යෙදෙන දේශපාලකයෝ සිටිති. රුක් රෝපණ වැඩ පිළිවෙල ඔවුන්ටත් ආදර්ශයක් වනු ඇත. අනෙක් අතට මුත්තාගේ අනුශාසනාව පිළිපැදීමක් ද වන්නේය.

පැල් බැඳගෙන උත්සව කිරීමද ගැමියාට පුරුදු වූවකි. ඉස්සර ගම්වල සල්ලිකාරයෝ හත්දොහේ මගුල් කාපු බව අපි අසා ඇත්තෙමු. තවමත් ගමේ පන්සලේ පිරිතක් පටන් ගත්තාම සති දෙක තුනක් දිගටම පවත්වනු ලැබේ. ඒ නිසා මේ විදියට ජනාධිපති පදවි ප්‍රාප්තියටත් උත්සව කිරීම ගැමියාට හුරු ක්‍රමය ම අනුගමනය කිරීමකැයි සිතිය හැකි ය.

මහින්ද රාජපක්ෂ අද දවසට රටට අවශ්‍ය රටට පිරිමහින නායකයා පමණක් නොව ඔහුට වඩා ඒ රාජකාරියට සුදුස්සකු අද නම් මුළු දිවයිනෙන්ම සොයා ගත නොහැකි බවත් පිලිග යුතු යථාර්ථයයි. ඒ" සමගම අමතක නොකළ යුතු යථාර්ථයක් ද ඇත. කොටි සංවිධානය පරාජය කළ විට මග යන එන පිරිසටත් දෙමින් කිරිබත් කෑ සමහරකුට ජයපැන් බීමේ උත්සව එපා වූ සැටියක් ජනාධිපති තරගය ළං වන විට පෙනී යාම ය. ඒ මහින්ද රාජපක්ෂ පරදන්නට සරත් ෆොන්සේකා සමත් වන බවට විශ්වාසයක් එජාප - ජවිපෙ දෙපක්ෂයෙන් බැහැර සමහරුන් තුළත් හට ගෙන තිබුණේ ඒ එපා වීම නිසා ය.

පැණි රස වුණත් දිගටම කන කොට අපුලක් ඇති විය හැකි ය. පැණි නොකා වට පිට බලන කොට කන්ට හරිහමන් දෙයක් නැත්නම් අර සතුට නොපිට පෙරළෙන්නටත් බැරි නැත.

මෙයත් ජන විඥානයේ කොටසක් බව උත්සව කරන්නන්ටත් අවබෝධ වනු ඇතැයි පතමු.





නොවැළැක්විය හැකි හේතු මත "සිනුවර හසුන" මෙවර පළ නොවන බව කරුණාවෙන් සළකන්න.

සිනුවර ආරච්චිල


From Page 4

## The Game Of.......

economic and cultural order.

Those daring to persist in their entrenched cultural practices are branded and painted by the same brush applied to those now- reviled groups. Prejudices are allowed to intensify in order to subjugate any insistence on unique identity. Notions of supremacist ideology are tacitly ignored, while suspicions are allowed to mature so that segregation and marginalising can be condoned when conditions become ripe for it.

The greatest gamblers in recorded history initiated the re-writing of history for the future, during the last decade. Facts fall by the wayside, reality is condemned as illusions replace it in tainted minds. It is a sad indictment that defies conventional logic and reason in this regressive phase of the world as we still know it.

Lasantha Pethiyagoda

From Page 4

## Paddy Cultivation.......

go with it.

It may be beneficial for the government to organize groups of farmers from the North and the East to visit the South and vice versa to learn more about farming methods and techniques from each other, and gain personal experience. These friendly ties may help not only to further and enhance the development of agriculture but also the age-old unity of the major races in the country that was meaninglessly battered by terrorism.

Dr. Mathu H Liyanage
PhD (Ireland), M. Litt (Australia), BA (Hons)(London)